වාරියපොල ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 නොවැම්බර් 28 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට වාරියපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). දේශීය ණය හා සංවර්ධන අරමුදල් ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් කාර්තුව සඳහා ගෙවිය යුතු ණය වාරිකය වූ රු.401,593 ක මුදල සඳහා ණයහිමියන් යටතේ වෙන් කිරීම් කර නොතිබුණි. එමෙන්ම ඊට අදාල ගෙවිය යුතු පොලිය රු.227,792 ක් වුවද, ණයහිමියන් යටතේ රු.220,107 ක් පමණක් වෙන්කිරීම් කර තිබුණි. ඒ හේතුවෙන් වර්ෂය අවසානයට ණයහිමි ශේෂය රු.409,278 ක් අඩුවෙන් හා වර්ෂයේ පොලී වියදම රු.7,685 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි

(ආ). වසරේ නිෂ්පාදන වියදම වූ රු.8,403,770 සමඟ නිෂ්පාදිත බ්ලොක් ගල් ප්‍රමාණය වූ 397988 සැලකීමේදී සමාලෝචිත වර්ෂයට අදාලව, බ්ලොක් ගලක නිෂ්පාදන පිරිවැය රු.21.11 ක් විය යුතු නමුත් එය රු.24.97 ක් ලෙස ගෙන නිමි තොගය අගය කිරීම හේතුවෙන් වර්ෂය අවසානයට නිමි තොගය රු.216,588 ක් වැඩියෙන් ගිණුම් ගතව තිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු හිඟහිටි එක්වන් මුදල් ශේෂය රු.8,657,810 ක් වුවද, ගිණුම් වලට එය රු.7,017,650 ක් ලෙස රු.1,640,160 ක් අඩුවෙන් ගෙන තිබුණි.

1.3.2 <u>අසම්භාව්‍ය බැරකම්</u>

ප්‍රාදේශීය සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයන්ට අදාලව සභාව විසින් එම අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම අරමුදලට ගෙවිය යුතු ශේෂය රු.3,023,766 ක්ව තිබුණි.

1.3.3 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

සමාලෝචිත වර්ෂයට අදාලව ලැබීම් හා ආරම්භක ශේෂය යටතේ ගිණුම් විෂයයන් 10 කට අදාලව ගිණුම අනුව සහ අදාල ලේඛන අනුව වූ අනුරූපී අගයන් අතර රු.362,150 ක නොසැසඳීම් පැවතුණි.

1.3.4 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.108,394,442 ක් වූ අතර, එයින් රු. 25,000,000 ක් 2010 වර්ෂයට අදාලව ලැබිය යුතු මුද්දර ගාස්තු විය.

(ආ). 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.48,527,406 ක් වූ අතර, එයින් රු. 6,031,346 ක් වසර 3 කට වඩා පැරණි ශේෂ විය.

1.3.5 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු. 29,703,228 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.8,381,390 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.14,226,467 ක් වීමෙන් මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු.5,845,077 ක පිරිහීමක් පැවතුණි. මෙකී මූල්‍ය ප්‍රතිඵලයට රු.46,166,397 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.54,531,526 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල අතිරික්තය රු.16,261 ක් දක්වා අඩුවී තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙර්.

(අ). සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.91,186,312 න් සියයට 76 ක් ලෙස රු.69,562,211 ක් උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම් වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.46,166,397 න් සියයට 87 ක් ලෙස රු.40,186,844 ක ප්‍රමාණයක් ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල් වලින් සමන්විත විය.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.91,186,312 න් සියයට 49 ක් ලෙස රු.45,173,675 ක් පෞද්ගලික පඩිනඩි වියදම වූ අතර ඉන් සියයට 73 ක් ලෙස රු.33,058,896 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී වෙනත් ආදායම් යටතේ ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.41,211,624 න් සියයට 16 ක් ලෙස රු.6,740,697 ක් පමණක් සභා අරමුදල් වැයකර තිබූ අතර, සියයට 84 ක් වූ රු.34,470,927 ක ඉතිරිය මගනැගුම, ගමනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතන ප්‍රතිපාදන වලින් ඉටුකල සංවර්ධන කාර්යයන් විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

වෙළඳ බලපත්‍ර, ව්‍යාපාර බදු, කඩකුලී, බදුකුලී වැනි ආදායම් ක්ෂේත්‍රයේදී එකතු කිරීම සඳහා නිශ්චිත බලයක් නොතිබුණද, සභාවේ ආදායම් එකතු කරන්නන් විසින් වර්ෂය පුරාම වරිපනම් බදු බලපත්‍ර ගාස්තු,කඩකුලී හා ව්‍යාපාර බදු වැනි ආදායම්ද, ක්ෂේත්‍රයේදී එකතු කර තිබුණි.

2.3.2 වරිපනම් හා බදු

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 32-42 දක්වා වූ රීතින් ප්‍රකාරව කාර්තු පදනම් කරගෙන හිඟ ලැයිස්තු සකස් කිරීමත්, අදාල නිවේදන නිකුත් කිරීමෙන් පසු දේපල තහනමට ගෙන හිඟ වරිපනම් බදු අයකිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමත් කල යුතු විය. එහෙත් 2013 දෙසැම්බර් 31 න් අවසන් කාර්තුව තුළ වීථි 6 ක ඒකක 29 ක් වෙනුවෙන් වූ රු.53,495 ක් සඳහා පමණක් හිඟ ලැයිස්තු පිළියෙල කර වරෙන්තු නිකුත් කර තිබුණු අතර, ඉන් ඒකක 16 කින් රු.27,280 ක් පමණක් අයකරගෙන තිබුණි. එමෙන්ම කටුපොත කොට්ඨාශයේ අවස්ථා 18 කට අදාලව දිගුකාලීනව පැවත එන රු.62,210 ක හිඟයක් ද පැවතුණි.

2.3.3 කඩකුලී

(අ). 2008 වර්ෂයේදී රු.805,000 කට ටෙන්ඩර් මගින් ලබාදී තිබූ බස්නැවතුම්පල උඩුමහල අංක 10 දරන කඩ කාමරයට අදාලව 2014 ජනවාරි 28 වන විටත් රු.150,000 ක් හිඟව පැවතුණි.

(ආ) සුළු පරිමාණ වෙළඳ සංකීර්ණයේ පළමු මහල කඩ 14 ක් 2011 ජනවාරි 22 දින එක්වන් මුදල් ක්‍රමයට රු.8,307,810 ක වටිනාකමකට ලබාදී තිබූ අතර මුදල් බැඳීම පිළිබඳව කොන්දේසි ප්‍රකාරව අදාල මුදල 2011 අගෝස්තු 15 දිනට පෙර ගෙවිය යුතු බව දක්වා තිබුණි. එහෙත් විගණන අවස්ථාව වූ 2014 ජනවාරි මාසය වන විට ද රු.7,757,810 ක් හිඟව පැවති අතර කඩ කාමර ඉදිකිරීමද ආරම්භ කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධන ඇගයීම

සභාව විසින් සමාලෝචිත වර්ෂය තුල ඉටුකිරීමට සැලසුම් කර තිබූ රු.450,000 ක් වටිනා සුභ සාධන කාර්යයන් 04 ක් සම්පූර්ණයෙන්ම ඉටුකර නොතිබුණු අතර, රු.23,266,000 වටිනා සුභසාධන කාර්යයන් 04 ක් සියයට 15 - සියයට 70 අතර ප්‍රතිශතයකින් පමණක් ඉටුකර තිබුණි. එමෙන්ම සභාව විසින් සමාලෝචිත වර්ෂය තුල ඉටුකිරීමට සැලසුම් කර තිබූ රු.4,300,000 ක් වටිනා ප්‍රාග්ධන කාර්යයන් 5 ක් සම්පූර්ණයෙන්ම ඉටුකර නොතිබූ අතර, රු.35,100,000 වටිනා ප්‍රාග්ධන කාර්යයන් 06 ක් සියයට 8 ත් සියයට 27 ත් අතර ප්‍රතිශතයකින් පමණක් ඉටුකර තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

සභාව විසින් 2008 - 2011 කාලය තුල අනුමත කල ගොඩනැගිලි අයදුම්පත් 697 කින් අනුකූලතා සහතික 48 ක් ලබාදී තිබුණි. අයදුම්පත්‍ර 649 සඳහා අනුකූලතා සහතික ලබා නොගැනීම හෝ ගොඩනැගිලි බලපත්‍ර කාලය දීර්ඝ කරවා නොගැනීම පිළිබඳව සභාව ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. එම ගොඩනැගිලි සියල්ල ඉදිකර තිබුණි නම් සභා අතුරු ව්‍යවස්ථා අනුව රු.649,000 ක ගොඩනැගිලි අනුකූලතා සහතික පත් ආදායමක්ද අදාල ගොඩනැගිලි ඉදිකිරීම අවසන්ව නොමැති නම් බලපත්‍ර කාලය වාර්ෂිකව දීර්ඝ කරවා ගැනීමේ ගාස්තු ලෙස රු.195,400 ක ආදායමක්ද සභාවට උපයාගත හැකිව තිබුණි.

3.3 <u>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම</u>

පළාත් පාලන ආයතන සඳහා වූ විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යටතේ වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් කිරිගව ව්‍යාපෘතිය සඳහා 2010 පෙබරවාරි 10 දින රු.500,000 ක් වාරියපොල ප්‍රාදේශීය සභාව වෙත ලබාදී තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘති ආධාර මුදලින් ඉතිරි රු.218,000 ක මුදල අදාල කාර්යයට නොයොදවා නිශ්කාර්යව පැවතුණි.

4. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). අයවැය පාලනය

(ඇ). මූල්‍ය පාලනය

(ඇ). ආදායම් පරිපාලනය

(ඉ). වත්කම් කළමනාකරණය